


# දම්මි යළිත් ජාතික පිලට



උස හා බර සමහර ක්‍රීඩාවන් හිදී ජයග්‍රහණ ලබා ගැනීමට උපකාර වන අවස්ථා එමටය. බොක්සිං, මල්ලවපොර වැනි ක්‍රීඩාවන් බර පංති වශයෙන් වෙන්කර පවත්වන්නේ එම ක්‍රීඩාවන්ට සහභාගි වන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට අසාධාරණයක් නොවීම අරමුණු කර ගනිමිනි. වොලිබෝල්, පැසිපන්දු, දැල්පන්දු වැනි ක්‍රීඩාවලදී කිසියම් බලපෑමක් කරන්නට කෙනෙකු උසට හැකියාව ඇත.

එසේ වුවත් එකම බර පංතියක ක්‍රීඩකයින් දෙදෙනෙක් අතර කෙරෙන බොක්සිං තරගයකදී ඊට උසින් පැහැදිලි වෙනසක් ඇති ක්‍රීඩකයෙකු සහභාගි වී සිටියහොත් ඔහුට වාසිදායක තතත්වයක් උදාවීමේ වැඩි ප්‍රවණතාවක් ඇත. මේ අනුව බලන කල කෙනෙකුගේ බරටත් වඩා උස ක්‍රීඩාපිටියේදී වැඩි වාසිදායක තත්ත්වයක් අත්කර දියහැකි සිද්ධාන්තයක් ලෙස සැලකිය හැකිය.

වොලිබෝල්, පැසිපන්දු යන ක්‍රීඩාවන් පිළිබඳ සඳහන් කරද්දී ප්‍රකාශ කළ හැක්කේ එම ක්‍රීඩාවන්ගෙන් ශ්‍රී ලංකාව තවමත් ආසියානු මට්ටමට හෝ පැමිණ නැති බවකි. සමහර විට ශ්‍රී ලංකා ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ උස මද බවද ඊට බලපා ඇති එක් සාධකයක් ලෙස සඳහන් කිරීම වරදක් විය හැකිය. දැල්පන්දු ද උසින් ප්‍රයෝජන ගතහැකි ක්‍රීඩාවක් ලෙස සඳහන් කළ හැකි නමුත්, ආසියානු කලාපය හා සසඳන විට ශ්‍රී ලංකාව දැල්පන්දු පිටියේ සිටින්නේ ඉහළම ස්ථානයකය. ආසියානු දැල්පන්දු ශූරතාව කිහිප වරක්ම දිනා ගනිමින් එය මනාව පැහැදිලි කරන්නට ශ්‍රී ලංකාවට හැකියාව ලැබී ඇත.

අවසන් වරට ආසියානු කුසලාන දැල්පන්දු තරගාවලියේ ශ්‍රී ලංකාවේ පවත්වනු ලැබුවේ 2001 වසරේය. එය එම තරගමාලාවේ 5 වැන්න විය. එදා දමයන්ති ජයතිලකගේ නායකත්වයෙ-න් තරග වැදුණු ශ්‍රී ලංකා පිල එහි අවසන් තරගයේදී ප්‍රබල සිංගප්පූරු පිල ලකුණු 55 - 54 ක් ලෙස පරදවා ආසියානු කුසලාන දිනා ගනු ලැබීය. එම තරගාවලියේදී ශ්‍රී ලංකා පිලේ වඩාත්ම අවධානයට ලක්වූ ක්‍රීඩිකාව වූයේ නායිකා දමයන්ති ජයතිලකය. එහෙත් එම කණ්ඩායමේ සිටි උසින් අඩුම ක්‍රීඩිකාවද ඇයමය.

ඒ අනුව එදා දමයන්ති කෙනෙකුට උස ලබාදෙන අමතර වාසියට සිය කුසලතා උපයෝගී කර ගනිමින් කදිම අභියෝගයක් ලබා දී තිබුණි. කෙසේ වුවත් සෙන්ටර් ස්ථානයේ ක්‍රීඩා කරන මේ දමයන්ති 2003 වසරින් පසු ශ්‍රී ලංකා පිලේ දක්නට නොවීය. ඇය එතැන් සිට මේ දක්වාම දක්නට ලැබුනේ ශ්‍රී ලංකා දැල්පන්දු කණ්ඩායමේ සෙන්ටර් ස්ථානය හිස්ව පැවතුණාක් මෙනි. දැල්පන්දු ක්‍රීඩාව ඔස්සේ මැලේසියාව, සිංගප්පූරුව, නවසීලන්තය, එංගලන්තය හා ජැමෙයිකාව ආදී රටවල් රැසක සංචාරය කරමින් ජය කෙහෙළි නංවා ඇති ඇය සිය ගමන ආරම්භ කර ඇත්තේ සියලු යස ඉසුරු සහිත නාගික පසුබිමකදී නොව කොළඹින් බොහෝ ඈත ගම්මානයකදීය.
ඇය මාස 6ක තරම් කුඩා අවදියේ සිටම හැදී වැඩී ඇත්තේ සිය මිත්තනියගේ ආදරය හා රැකවරණය නොඅඩුව ලබමිනි.
පන්නල ජාතික පාසලට ඇතුළත්ව අධ්‍යාපනය ලද දමයන්තිගේ පළමු දැල්පන්දු පුහුණුකාරිණිය මාරි ෆොන්සේකා ය. ඒ දවස්වල පුහුණුවීම් සඳහා අවශ්‍ය බොටම් ඇගේ මිත්තනිය ඇයට ගෙනැවිත් දී ඇත්තේ ගමේ පොලෙනි. ඒවායේ තිබූ අක්‍රමවත් බව නිසාම පුහුණුවීම් වල නිරතව සිටියදී බොහෝ අපහසුවන්ට මුහුණ දුන් බව දමයන්ති සඳහන් කළාය.
ඒ සියලු අපහසුතාවන් දරා ගමිනින් සිය උපරිම කුසලතා දැක්වීමට දමයන්ති බලවත් පරිශ්‍රමයක් දරන්නට ඇත. ශ්‍රී ලංකා පිලේ නායිකාව දක්වා ගමන් කරන්නට ඇයට අත්වැල සපයන්නට ඇත්තේද ඒ උත්සාහයේම ප්‍රතිඵලය විය හැකිය. ජාතික මට්ටමේ පාසල් තරගමාලාවන්ට සහභාගිවීම සඳහා පන්නල ජාතික පාසල් කණ්ඩායම සමග කොළඹ පැමිණි සෑම අවස්ථාවකම කොළඹ සුපිරි පාසල් නියෝජනය කළ ක්‍රීඩිකාවන්ගේ කෙනෙහිලිකම් වලට පවා තම පිලේ ක්‍රීඩිකාවන්ට අනන්තවත් මුහුණ දෙන්නට එකල සිදුවූ බව ඇය සිහිපත් කළාය.

එහෙත් පසු කලෙක ඒ බොහෝ දෙනෙක් ඇගේ නායකත්වයට යටත්ව සිටීම දෛවයේ සරදමක් බඳු විය. කොළඹ දී ලද කටුක අත්දැකීම් දමයන්තිගේ හිත තවත් ශක්තිමත් කළද තම පිලේ සමහර ක්‍රීඩිකාවන් අධෛර්යට පත් කිරීමට එම අත්දැකීම් හේතුවූ බව ඇගේ අදහසය. මේ නිසාම එදා තම පාසලේ සිටි තමන්ට වඩා දක්ෂ ක්‍රීඩිකාවන් කිහිප දෙනෙකුගේම සේවය පිලට අහිමි වී ගිය බවද ඇය නිහතමානීව ප්‍රකාශ කළාය. දක්ෂතා අතින් තමන්ට වඩා ඉදිරියෙන් සිටි සමහර ඇගේ මිතුරියන් දැල්පන්දු හැර ගියද සිය ගමන අතරමග නතර නොකළ ඇයට විද්‍යාපීඨ පත්වීමක් ලැබී තිබුණි. නමුත් එය ප්‍රතික්ෂේප කළ දමයන්ති ශ්‍රී ලංකා වරාය අධිකාරිය ඔස්සේ සිය වෘත්තීය ජීවිතයට පිවිසුනි.

තවමත් එහි සේවය කරන ඇය දැන් 34 හැවිරිදි එක්දරු මවකි. සිය සැමියා රුක්ෂාන් පෙරේරා හා පුංචි සිඟිත්තිය සෞල්‍යා ගිත්මිණි සමග මේ විඳින්නේ නැවුම් අත්දැකීමකි.
දමයන්ති ජයතිලකට දැන් හොඳ ස්වාමි පුරුෂයෙකු මෙන්ම සුරතල් දියණියකද ලැබී ඇත. එහෙත් ඇය තවමත් දැල්පන්දු ක්‍රීඩාව අතහැර දමන්නටද අදහසක් නැත.
පසුගිය කාලයේ ඇය ශ්‍රී ලංකා පිල නියෝජනය නොකලද ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙනුවෙන් තරග වදිමින් තම කුසලතා රැක ගන්නට සමත්ව සිටියාය.

මේ නිසා කලක් තිස්සේ පැවැති නිහැඬියාව බිඳ දමමින් නැවතත් ශ්‍රී ලංකා පිලට එක්වීමට පසුගියදා දමයන්තිට හැකියාව ලැබුණි.
ඇය දැන් නැවතත් ඇගේ සුපුරුදු වේගවත් තරග විලාශයට පැමිණි ඇති බව ජාතික පුහුණුකාරිනී හයසින්ත් විජේසිංහ ගේ අදහසය. දැල්පන්දු ක්‍රීඩාවේදී දක්ෂ ක්‍රීඩිකාවක ලෙස කැපී පෙනෙන්නට නම් ප්‍රතිවාදී පිලේ ක්‍රීඩිකාවන්ගේ මෙන්ම තම පිලේ ක්‍රීඩිකාවන්ගේද මුහුණු බැදු පමණින් හිත කියවීමේ හැකියාව තිබිය යුතුය. තීරණ ගැනීම්, තීරණ වෙනස් කිරීම්, ඇසිපිය හෙලන සැනින් කළ යුතුය. එසේම තමන් ඉදිරියෙන් සිටින ක්‍රීඩිකාවන් මෙන්ම පිටුපස සිටින ක්‍රීඩිකාවන්ද ස්ථාන ගතව සිටින ආකාරයත් දැකීමේ හැකියාවද තිබිය යුතුය.
දැල්පන්දු පිටියේ දම්මි යන ආදර නමින් හඳුන්වන දමයන්ති ජයතිලක එවන් හැකියා-වන්ගෙන් සපිරි අපූරු ක්‍රීඩිකාවකි.

# සනත් ජයසූරිය ෂේන් වෝන් පසු කරයි

*එක් දින තරග ඉතිහාසයේ වැඩිම තරග සංඛ්‍යාවකට සහභාගි වූ ක්‍රීඩකයා*



*සනත් ජයසූරිය තරග 393 කදී පන්දු 13796 ක් යවමින් ලකුණු 10951 කට කඩුලු 295 ක් බිඳ හෙළීමට සමත්ව ඇත. ෂේන් වෝන් තරග 194 කදී ලකුණු 7541 කට කඩුලු 293 ක් බිඳ හෙළා තිබේ.*

පසුගියදා පැවැති ඇෆ්රෝ ඒෂියා කුසලාන ක්‍රිකට් තරගාවලියේ බැංග්ලෝරයේ පැවැති ප්‍රථම තරගයේදී සනත් ජයසූරිය එක් දින ජාත්‍යන්තර තරගවල වැඩිම කඩුලු සංඛ්‍යාවක් දවාලු පන්දු යවන්නන් අතර නව වැනි ස්ථානයට පත්වීමට සමත් විය. මෙහිදී ඔහු 10 වැනි ස්ථානයේ සිට පසු කළේ ෂේන් වෝන්ව වීම විශේෂ සිද්ධියකි.

මේ අනුව සනත් ජයසූරිය තරග 393 කදී පන්දු 13796 ක් යවමින් ලකුණු 10951 කට කඩුලු 295 ක් බිඳ හෙළීමට සමත්ව ඇත. ෂේන් වෝන් තරග 194 කදී ලකුණු 7541 කට කඩුලු 293 ක් බිඳ හෙළා තිබේ. මෙම ලැයිස්තුවේ ඉදිරියෙන්ම සිටින්නේ වසීම් අක්‍රම්ය. ඔහු තරග 356 කදී කඩුළු 502 ක් බිඳ හෙළා තිබේ. දෙවැනි ස්ථානයේ පසුවන මුත්තයියා මුරලිදරන් තරග 297 කදී කඩුලු 455 ක් බිඳ හෙළා ඇත. චමින්ද වාස් තරග 300 කදී කඩුලු 383 ක් බිඳ හෙළමින් සිව් වැනි ස්ථානයේ පසුවෙයි.

මේ අතර සනත් ජයසූරිය එක් දින ජාත්‍යන්තර තරග 393 කට සහභාගි වෙමින් එක් දින තරග ඉතිහාසයේ වැඩිම තරග සංඛ්‍යාවකට සහභාගි වූ ක්‍රීඩකයා බවටද පත්ව තිබේ. මෙහි දෙවැනි ස්ථානයේ සිටින්නේ තරග 384 කට සහභාගි වී ඇති සචින් ටෙන්ඩුල්කාර්ය.

GATEWAY
LAWYERS

- Advice on Legal Matters
- Business & Commercial
- Conveyancing - Sale or Purchase of Houses, Vacant Land, Units, Flats, Shops, Factories & Farms
- General, Medical or Enduring Powers of Attorney
- Wills & Estate Planning

*Professional, Quality Service Assured*

Senanie Kurukularatne LL.B, Grad Dip.LP
Barrister & Solicitor
Attorney -at- Law - Sri Lanka

Phone : 03 87869682
Fax : 03 87869681
Mobile : 0414 660 513
Email : gateway5@bigpond.net.au
17, Glenview Rise, Berwick, VIC 3806 Austraila